කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சு

MINISTRY OF INDUSTRY AND ENTREPRENEURSHIP DEVELOPMENT










# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

## කාර්ය සාධන විශ්ලේෂණ වාර්තාව

සැලසුම් අංශය - 2025

# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB)

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ අපනයන ප්‍රවර්ධනය සඳහා වන ප්‍රමුඛතම ආයතනය වන අපනයන සංවර්ධන මණ්ඩලය (EDB), 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනතේ විධානය යටතේ ක්‍රියාත්මක වේ. එහි මෙහෙවර වන්නේ උපායමාර්ගික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, වෙළඳපල ප්‍රවේශය පහසු කිරීම සහ තරඟකාරිත්වය වැඩි දියුණු කිරීම මගින් රටේ භාණ්ඩ හා සේවා අපනයන සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීමයි.


සමාලෝචන කාලය (2020–2024) තීරණාත්මක සාධක කිහිපයකින් හැඩගැසී ඇත:

- ගෝලීය බාධාවන් - COVID-19 වසංගතය වෙළෙඳාම හා නිෂ්පාදනයට දැඩි බාධා ඇති කිරීම.
- ආර්ථික අභියෝග - ඉහළ යන භාණ්ඩ ප්‍රවාහන පිරිවැය, මුදල් අවප්‍රමාණය සහ උද්ධමන පීඩනය අපනයනකරුවන්ට බලපාන ලදී.
- යථා තත්ත්වයට පත්වීම සහ පරිවර්තනය - වසංගතයෙන් පසු වසරවලදී ඩිජිටල් වෙළඳ ප්‍රවර්ධනය, තිරසාර නිෂ්පාදනය සහ වෙළඳපල විවිධාංගීකරණය දෙසට මාරුවීමක් දක්නට ලැබුණි.
- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය බහු-පාර්ශ්වීය ප්‍රතිචාර මත ක්ෂණික අර්බුද අවම කිරීම, මධ්‍ය කාලීන ප්‍රතිසාධන පියවර සහ දිගුකාලීන උපායමාර්ගික මුලපිරීම් සඳහා කටයුතු කිරීම.

### 2020–2024 කාලය තුළ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය අත්කර ගත් ප්‍රධාන ප්‍රතිඵල:

- වෙළඳ භාණ්ඩ සහ සේවා යන දෙකම යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් 2020 දී ඇ.ඩො.මි. 12,334.64 ක්ව පැවැති අපනයන ආදායම 2024 දී ඇ.ඩො.මි. 16,344.90 දක්වා වර්ධනය වීම.
- සේවා අපනයනවල කැපී පෙනෙන වැඩිවීමක් සිදු වූ අතර, විශේෂයෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT)/BPM සහ සැපයුම් ක්ෂේත්‍රයන්හි, එය ඇ.ඩො.මි. 1,889.03 සිට ඇ.ඩො.මි. 3,572.96 දක්වා වැඩි විය.
- ඩෙන්මාර්කය, ලැට්වියාව, කැනඩාව, දකුණු කොරියාව සහ මැදපෙරදිග ඇතුළු නව වෙළඳපොළවල් පුළුල් වීම.
- නව අපනයනකරුවන්ගේ සංවර්ධන වැඩසටහන, එක් ගමකට එක් නිෂ්පාදනයක් (OVOP) සහ අපනයන නිෂ්පාදන ගම්මානය (EPV) මුලපිරීම් හරහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ධාරිතාව ශක්තිමත් කිරීම.
- ශ්‍රී ලාංකික නිෂ්පාදනවල ගෝලීය ප්‍රතිරූපය වැඩිදියුණු කිරීම සඳහා ජාතික අපනයන සන්නාමය - " Your Vital Island " හඳුන්වාදීම.
- ආංශික වශයෙන් විශේෂිත වෙළඳ නාමකරණය සහ සහතික කිරීම සංවර්ධනය කිරීම, විශේෂයෙන් ලංකා කුරුඳු සඳහා GI සහතික කිරීම.
- ඇසුරුම්කරණ ප්‍රමිතීන් සහ නවෝත්පාදනයන් ආමන්ත්‍රණය කිරීම සඳහා 2023 දී ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය (NPC) පිහිටුවීම.

**අපගේ සේවාවන්**




## 2. අපනයන කාර්ය සාධන විශ්ලේෂණය

### 2.1 අපනයන කාර්ය සාධනය 2020–2024

පහත වගුව 2020-2024 කාලය තුළ වෙළඳ භාණ්ඩ හා සේවා අපනයනවල කාර්ය සාධනය නිරූපණය කරයි.

**වගු අංක 2.1: අපනයන කාර්ය සාධනය 2020–2024**

| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| **වෙළඳ භාණ්ඩ අපනයනය (ඇ. ඩො. මි.)** | **10,047.4** | **12,498.6** | **13,106.4** | **11,910.8** | **12,771.9** |
| **සේවා අපනයන * (ඇ. ඩො. මි.)** | **2,287.2** | **1,929.2** | **1,889.0** | **3,195.4** | **3,573.0** |
| **සේවා අපනයන(ඇ. ඩො. මි.)** | **12,334.6** | **14,427.8** | **14,995.7** | **15,106.1** | **16,344.9** |

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව

* අපනයන සංවර්ධන මණ්ඩලය සේවා අපනයන ලෙස ICT/BPM, ඉදිකිරීම්, මූල්‍ය සේවා සහ ප්‍රවාහන සහ සැපයුම් සේවා සලකයි.

**ප්‍රධාන නිරීක්ෂණ:**

- 2020 COVID-19 හේතුවෙන් අපනයනවල පහළ යාමක් දක්නට ලැබුණ නමුත් 2021 දී වෙළඳ භාණ්ඩ අපනයනය ඇමරිකානු ඩොලර් මිලියන 12,498.6 දක්වා ඉහළ යාමත් සමඟ යථා තත්ත්වයට පත්වීම ආරම්භ විය.
- සංචාරක සීමාවන් අතරතුර සේවා අපනයන පහත වැටුණද 2024 වන විට එය යථා තත්ත්වයට පත් විය.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි කලමනාකරණ අංශය (ICT/BPM), සැපයුම් සහ අගය එකතු කළ කෘෂිකාර්මික නිෂ්පාදනවල වර්ධනය යථා තත්ත්වයට පත්වීමට සැලකිය යුතු ලෙස දායක විය.

## 2.2 ආංශික කාර්ය සාධනය

- කෘෂිකර්මාන්තය - තේ, කුළුබඩු, පොල් නිෂ්පාදන සහ ධීවර කර්මාන්තයේ ශක්තිමත් කාර්ය සාධනයක්, නව අගය එකතු කළ නිෂ්පාදන ඉලක්ක ගත වෙළඳපොළවල් තුළ දියත් කිරීම.
- කාර්මික - ඇඟලුම් විශාලතම දායකත්වය ලබා දුන් අතර රබර් ආශ්‍රිත නිෂ්පාදන සහ විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික් උපාංග (EEC) අපනයන අංශ ස්ථාවර ඉල්ලුමක් පෙන්නුම් කළේය.
- සේවා - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි කලමනාකරණ අංශය, දුරස්ථ වැඩ කිරීමේ ප්‍රවණතාවලින් ප්‍රතිලාභ ලබමින් තම වෙළඳපල කොටස පුළුල් කළේය.

පහත 2.2 වගුව මඟින් සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ, අංශ අනුව අපනයන කාර්ය සාධනය සහ සාමාන්‍ය වර්ධනය පෙන්නුම් කරයි. 2020 සහ 2024 අතර, ශ්‍රී ලංකාවේ මුළු භාණ්ඩ හා සේවා අපනයන සාමාන්‍ය වර්ධන අනුපාතය 5.97% කින් වැඩි වී 2024 දී ඇ. ඩො. බි. 16.24 දක්වා ළඟා විය.

වෙළඳ භාණ්ඩ අපනයනය 4.32% සාමාන්‍ය අගයකින් ඉහළ යාම, ඇඟලුම් සහ රෙදිපිළි (ඇමරිකානු ඩොලර් බිලියන 5.05, 1.66% කින් ඉහල යාම), තේ (2.81% කින් ඉහල යාම), සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන (3.43% කින් ඉහල යාම) මගින් දායකත්වය දෙනු ලබන අතර, ඉහළ වර්ධන අංශ අතරින් ඛනිජ තෙල් නිෂ්පාදන (35.62% කින් ඉහල යාම), බෝට්ටු නිෂ්පාදන (64.20% කින් ඉහල යාම), සහ මැණික් සහ ස්වර්ණාභරණ (24.22% කින් ඉහල යාම) අන්තර්ගත වේ. ප්‍රවාහන සහ සැපයුම් (17.26% කින් ඉහල යාම) සහ තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණය (7.66% කින් ඉහල යාම) යන අංශ මගින් මෙහෙයවනු ලැබූ සේවා අපනයන වඩාත් වේගයෙන් වර්ධනය වූ අතර, සාමාන්‍යයෙන් 13.40% ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

**වගු අංක 2.2: අංශ අනුව අපනයන කාර්ය සාධනය, 2020-2024**

| | 2020 | 2021 | 2022 | 2023 | 2024 | සාමාන්‍ය වර්ධනය % (2020-2024) |
|---|---|---|---|---|---|---|
| ඇඟලුම් සහ රෙදිපිළි | 4,405.83 | 5,415.91 | 5,933.52 | 4,864.53 | 5,050.99 | 1.66 |
| තේ | 1,240.94 | 1,324.38 | 1,258.81 | 1,309.90 | 1,435.87 | 2.81 |
| රබර් ආශ්‍රිත | 816.18 | 1,092.60 | 1,018.40 | 930.24 | 1,001.54 | 2.48 |
| පොල් ආශ්‍රිත | 664.58 | 836.09 | 817.09 | 708.70 | 856.79 | 3.43 |
| දියමන්ති, මැණික් සහ ආභරණ | 148.35 | 294.05 | 399.77 | 500.00 | 381.90 | 24.22 |
| විදුලි සහ ඉලෙක්ට්‍රොනික | 328.58 | 422.17 | 483.65 | 486.66 | 421.98 | 6.43 |

| | 2020 | 2021 | 2022 | 2023 | 2024 | සාමාන්‍ය වර්ධනය % (2020-2024) |
|---|---|---|---|---|---|---|
| කුළු බඩු සහ අත්‍යවශ්‍ය තෙල් | 335.50 | 456.78 | 370.30 | 397.78 | 461.85 | 5.01 |
| ආහාර සහ පාන වර්ග | 351.36 | 443.99 | 426.39 | 427.97 | 478.05 | 5.79 |
| මුහුදු ආහාර | 189.80 | 274.07 | 269.02 | 262.24 | 232.99 | 3.66 |
| විසිතුරු මාළු | 13.03 | 20.97 | 21.74 | 26.38 | 24.46 | 14.89 |
| එළවළු | 25.74 | 27.44 | 27.80 | 29.19 | 29.79 | 3.54 |
| පලතුරු සහ ඇට වර්ග | 35.66 | 39.46 | 38.79 | 43.27 | 41.72 | 4.06 |
| වෙනත් අපනයන භෝග | 67.60 | 68.58 | 92.41 | 91.30 | 65.02 | 2.08 |
| මල් සහ පත්‍ර | 12.62 | 16.19 | 14.66 | 15.01 | 13.67 | 0.84 |
| බෝට්ටු නිෂ්පාදන | 2.39 | 37.81 | 17.40 | 78.50 | 41.10 | 64.20 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 271.80 | 234.36 | 283.22 | 539.40 | 1,063.50 | 35.62 |
| වෙනත් | 1,137.44 | 1,493.73 | 1,633.47 | 1,199.73 | 1,170.72 | -1.62 |
| **මුළු වෙළඳ භාණ්ඩ අපනයනය** | **10,047.40** | **12,498.58** | **13,106.44** | **11,910.80** | **12,771.94** | **4.32** |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ | 1,010.24 | 1,216.50 | 1,112.38 | 1,228.00 | 1,474.80 | 7.66 |
| ඉදිකිරීම් | 7.00 | 9.65 | 9.05 | 354.90 | 203.10 | 103.40 |
| මූල්‍ය සේවා | 95.60 | 94.80 | 91.74 | 64.00 | 50.80 | -16.57 |
| ප්‍රවාහන සහ සැපයුම් | 1,173.90 | 608.25 | 675.85 | 1,550.38 | 1,742.83 | 17.26 |
| **මුළු සේවා අපනයන** | **2,287.24** | **1,929.20** | **1,889.03** | **3,197.28** | **3,471.53** | **13.40** |
| **මුළු භාණ්ඩ හා සේවා අපනයන** | **12,334.64** | **14,427.78** | **14,995.43** | **15,108.08** | **16,243.47** | **5.97** |

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව, අපනයන සංවර්ධන මණ්ඩලය

**වෙළඳපල විවිධාංගීකරණය**

- උතුරු සහ නැගෙනහිර යුරෝපය, නැගෙනහිර ආසියාව සහ මැද පෙරදිග වෙළඳපොළවල් දක්වා ව්‍යාප්ත වී ඇත.
- ඩෙන්මාර්කය, ලැට්වියාව, කැනඩාව සහ දකුණු කොරියාව යන රටවල ප්‍රධාන නව ගැනුම්කරුවන් ස්ථාපිත කර ඇත.
- බහුවිධ අංශවල ඒකාබද්ධ ව්‍යාපාර සහ ආයෝජන හවුල්කාරිත්වයන් පිහිටුවා ඇත.

## 3. උපායමාර්ගික මුලපිරීම් සහ වැඩසටහන් ප්‍රතිඵල

### 3. 1 වෙළඳපල සංවර්ධනය

- **ප්‍රධාන ගෝලීය වෙළඳ ප්‍රදර්ශනවල සහභාගීත්වය:** සමාලෝචනයට භාජනය වන කාල පරිච්ඡේදය තුළ, ශ්‍රී ලංකාව ආහාර හා පාන වර්ග, මැණික් හා ස්වර්ණාභරණ, ඇඟලුම්, ඖෂධ, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහ බෝට්ටු නිෂ්පාදනය වැනි අංශ හරහා පුළුල් පරාසයක ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා ක්‍රියාකාරීව සහභාගී විය. ප්‍රධාන සිදුවීම් අතරට Gulfood, BioFach, Anuga, SIAL, Seafood Expo Global,

Organic & Natural Expo Dubai සහ බැංකොක් මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනය, ඩසල්ඩෝෆ් බෝට්ටු ප්‍රදර්ශනය සහ ජපන් තොරතුරු තාක්ෂණ සතිය වැනි අංශ-විශේෂිත ප්‍රදර්ශන ඇතුළත් විය.

- මේ සඳහා සමාගම් 450 කට අධික සංඛ්‍යාවක් සහභාගී වූ අතර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර 120 කට අධික සංඛ්‍යාවක් ඇතුළුව, ගෝලීය ගැනුම්කරුවන්ට ශ්‍රී ලාංකික නිෂ්පාදන සහ සේවා ප්‍රදර්ශනය කිරීමට වේදිකාවක් සපයන ලදී. මෙම කාලපරිච්ඡේදය පුරාවට, ඇමරිකානු ඩොලර් මිලියන 75 ක් ඉක්මවන, තහවුරු කළ අපනයන ඇණවුම් ජනනය කරන ලද අතර, වෙළඳපල ප්‍රවේශය සහ අපනයන ඉපැයීම් පුළුල් කිරීම සඳහා මෙම ප්‍රවර්ධන මුලපිරීම්වල සැලකිය යුතු දායකත්වය පිළිබිඹු කරයි. මෙමගින් සිය ගණනක් විමසීම් සමඟ, බොහෝ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ජාත්‍යන්තර වෙළඳපොළට හඳුන්වා දෙන ලදී, සමාගම් කිහිපයක් PGI සහතික කළ කුරුඳු පාදක අයිතම, වීගන් පැටිස් සහ cloud based මත පදනම් වූ ICT විසඳුම් වැනි නව්‍ය නිෂ්පාදන දියත් කරන ලදී.

3.1 වගුවේ දැක්වෙන්නේ සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලාංකික අපනයනකරුවන්ගේ සහභාගීත්වයයි.

**වගු අංක 3.1: 2020 - 2024 කාලය තුළ ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලාංකික අපනයනකරුවන්ගේ සහභාගීත්වය**

| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| වෙළඳ ප්‍රදර්ශන ගණන | 4 | 7 | 14 | 18 | 13 |
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඇතුළුව සහභාගීවන්නන් ගණන | 50 | 64 | 91 | 213 | 189 |
| ඇණවුම්වල වටිනාකම (ඇමරිකානු ඩොලර් මිලියන) | 21.0 | 7.73 | 36.16 | 22.21 | 4.72 |

මූලාශ්‍ර: අපනයන සංවර්ධන මණ්ඩලය

- එයට අමතරව, මෙම කාලපරිච්ඡේදය තුළ COVID-19 වසංගතය වැනි අභියෝග මධ්‍යයේ වුවද, විවිධ කර්මාන්ත හරහා මාර්ගගත හා භෞතික B2B රැස්වීම්, වෙළඳ නියෝජිතයින්, වෙබිනාර් සහ ආංශික ප්‍රවර්ධන වැඩසටහන් 150 කට වැඩි ප්‍රමාණයක් භාවිතා කරමින්, ගෝලීය වෙළඳපල සම්බන්ධතා පවත්වා ගෙන යන ලදී.
- ලන්ඩනයේ පැවති "Sourced Sri Lanka" Roadshow (2024) වැඩසටහනේදී "Your Vital Island" සන්නාමය ප්‍රදර්ශනය කරන ලද අතර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ කාන්තා ව්‍යවසායකයින් ප්‍රවර්ධනය කරන ලදී.


### 3. 2 නිෂ්පාදන සංවර්ධන වැඩසටහන්

- ලංකා කුරුඳු සඳහා GI සහතිකය - යුරෝපා සංගමය තුළ ප්‍රවර්ධන ව්‍යාපාර පුළුල් කිරීම.
- ආයුර්වේද, මැණික් සහ ස්වර්ණාභරණ, සැකසූ ආහාර සහ ඖෂධ සඳහා වෙළඳ නාම සංවර්ධනය.
- ඇසුරුම්කරණ නවෝත්පාදනයන් සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහාය වීම සඳහා ජාතික ඇසුරුම් මධ්‍යස්ථානයක් පිහිටුවීම.

### 3.3 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සංවර්ධන වැඩසටහන්

- නව අපනයනකරුවන් සංවර්ධන වැඩසටහන (NEDP)
  සාර්ථක අපනයනකරුවන් බවට පත්වීම සඳහා විභව ව්‍යවසායකයින් හඳුනා ගැනීම, පෝෂණය කිරීම සහ සහාය දීම කෙරෙහි මෙම වැඩසටහන ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළේය. 2020 - 2024 කාලය තුළ NEDP වැඩසටහන යටතේ සහාය ලැබූ සමාගම් පහත ප්‍රස්ථාරයේ දැක්වේ.

**ප්‍රස්ථාර අංක: 3.3 NEDP 2020-2024 යටතේ සහාය දක්වන සමාගම්**




මූලාශ්‍රය: අපනයන සංවර්ධන මණ්ඩලය

- අපනයන නිෂ්පාදන ගම්මාන (EPV) - කෝපි, අඹ, වැනිලා සහ කඩදාසි මත පදනම් වූ නිෂ්පාදන පොකුරු ස්ථාපිත කිරීම.

- එක් ගමකට එක් නිෂ්පාදනයක් (OVOP) - විශේෂිත නිෂ්පාදන ගම්මාන සංවර්ධනය කිරීම, ඵලදායිතාව වැඩි දියුණු කිරීම සහ ගෝලීය වෙළෙඳපොළ තුළ ශ්‍රී ලාංකික නිෂ්පාදනවල තරඟකාරිත්වය ඉහළ නැංවීම මෙම වැඩසටහනේ අරමුණයි. විශේෂයෙන් කෘෂිකර්මාන්තයේ සැපයුම් සීමාවන්ට මුහුණ දීම සඳහා 2017 දී දියත් කරන ලද මෙම වැඩසටහන අපනයන සැපයුම් දාමයට අත්‍යවශ්‍ය වන කලාපීය කුඩා හා මධ්‍ය පරිමාණ ගොවීන් සහ නිෂ්පාදක ජාල ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. එමගින් ප්‍රමාණවත් නොවන අමුද්‍රව්‍ය, ඉහළ නිෂ්පාදන පිරිවැය, ගැනුම්කරු සම්බන්ධතා නොමැතිකම සහ මූල්‍ය සඳහා සීමිත ප්‍රවේශය වැනි ප්‍රධාන අභියෝග සඳහා විසඳුම් ලබා දිය හැක. සැපයුම්කරු ධාරිතාව වැඩිදියුණු කිරීම, වෙළඳපල සම්බන්ධතා සැපයීම සහ අපනයනකරුවන් සමඟ ආපසු මිලදී ගැනීමේ කටයුතු පහසු කිරීම මගින්, මෙම වැඩසටහන යටතේ කලාපීය සංවර්ධනය මෙහෙයවීමට, රැකියා නිර්මාණය කිරීමට, ග්‍රාමීය ජීවන තත්වයන් වැඩිදියුණු කිරීමට මෙන්ම ජාතික අපනයන ආදායම වැඩි කිරීමට දායකත්වයක් ලබා දේ.

සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ මෙම වැඩසටහන යටතේ ස්ථාපිත නිෂ්පාදන ගම්මාන සහ ගොවීන් සංඛ්‍යාව සහ ව්‍යාපෘති ප්‍රතිඵල පහත වගුවේ දැක්වේ.

වගු අංක 3.3 : 2020 - 2024 කාලය තුළ ස්ථාපිත නිෂ්පාදන ගම්මාන, ගොවීන් සංඛ්‍යාව සහ ව්‍යාපෘති ප්‍රතිඵල

| වසර | ව්‍යාපෘතිය | ගොවීන්ගේ සංඛ්‍යාව | ප්‍රතිඵල | |
|---|---|---|---|---|
| | | | රු. මිලියන | කි.ග්‍රෑ. |
| 2018-2023 | කඩදාසි කූඩ | 350 | 100 | |
| 2019-2023 | තවාෂි බුරුසු | 10 | 10 | |
| 2023 | කරපිංචා කොළ | 32 | 0.261 | 1,044 |
| 2023 | කාබනික ගොටුකොළ | 108 | | |
| 2023-2024 | අනෝදා කොළ | 26 | | 1,000 මාස දෙකකට වරක් |
| 2024 | ස්කොච් බොනට් (මිරිස් ගම්මිරිස්) | 7 | | 90 |
| 2024 | අනෝදා | 83 | | |
| 2019-2020 | කෘෂි වැනිලා ව්‍යාපෘතිය | 1036 | 29.97 | 8425.725 |
| 2020-2021 | කෝපි ව්‍යාපෘතිය | 880 | 18.45 | 67813 |
| 2023-2024 | විජලනය කළ නිල්කටරොළු මල් | 120 | 8.566 | 1730 |
| 2019-2024 | ඉඟුරු | 120 | සම්බන්ධිත අපනයනකරුට සහ දේශීය වෙළඳපොළට සැපයීම. | |
| 2019-2024 | විසිතුරු මාළු | 45 | | |
| 2019-2024 | කුරුඳු | 73 | | |

මූලාශ්‍රය : අපනයන සංවර්ධන මණ්ඩලය

### 3.4 කාන්තා ව්‍යවසායක සංවර්ධනය

- 2024 දී ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානය සමඟ “ITC She Trades Hub” දියත් කරන ලදී.
- කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා සන්නාමකරණ වැඩමුළු, තරඟ සහ දැනුම ලබා ගැනීම සඳහා ක්ෂේත්‍ර චාරිකා පවත්වන ලදී.

**අපනයනකරුවන්ට පහසුකම් සැපයීම සහ ධාරිතා වර්ධනය**

- 2020–2024 අතර කාලය තුළ ආනයන-අපනයන ක්‍රියා පටිපාටි පිළිබඳ සහතික පාඨමාලා එකොළහක් (11) සහ ජාත්‍යන්තර වෙළඳාමේ මෙහෙයුම් අංශ පිළිබඳ පාඨමාලා පහක් (05) පවත්වන ලදී.
- වෙළඳපල බුද්ධිය: 2020–2024 අතර කාලය තුළ වෙළඳපල අනතුරු ඇඟවීම් සහ පර්යේෂන වාර්තා/අධ්‍යයන 48ක් සිදු කරන ලදි.
- ප්‍රකාශන: ‘Business Lanka’ සඟරාව, Expo News සහ අපනයන කාර්ය සාධන දර්ශක (Export Performance Indicators 2023).
- උපකාරක කවුළුව: COVID-19 වසංගතය විසින් එල්ල කරන ලද අභියෝග මධ්‍යයේ, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන උපකාරක කවුළුව (Help Desk) 2020 දී විධිමත් කරන ලද අතර 24/7 සහාය සේවා සපයන ආංශික උපකාරක කවුළු 14 ක් ඇතුළත් කර පුළුල් කරන ලදී. මෙම වැඩිදියුණු කිරීම මඟින් මෙම තීරණාත්මක කාල පරිච්ඡේදය තුළ අපනයනකරුවන්ට වඩාත් ඵලදායී හා කාලෝචිත සහාය ලබා දීමට හැකි විය.

**ප්‍රතිපත්ති සහ ආයතනික සහාය**

- අපනයනකරුවන්ගේ සංසද - මෙහෙයුම් සහ ප්‍රතිපත්තිමය ගැටළු සාකච්ඡා කිරීමට සංසද තුනක් පවත්වන ලදි.
- උපදේශක සභා - වසර පහක කාලයක් සඳහා සඳහා 2021 දී පිහිටුවන ලද කමිටු 24 ක් පිහිටුවන ලද අතර ඒවා හමුවී අපනයන ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලදි.
- වෙළඳ පහසුකම් සැපයීමේ කාර්ය සාධක බලකාය (Trade Facilitation Task Force) - ආයතන 35 ක් සමඟ සම්බන්ධීකරණය කිරීම සඳහා 2024 දී දියත් කරන ලදී.

**විශේෂ මුලපිරීම්**

ශ්‍රී ලංකාවේ තිරසාර කාබනික කෘෂිකර්ම පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා පහසුකම් සැලසීම - අපනයන සංවර්ධන මණ්ඩලය යටතේ ඇති ජාතික කාබනික පාලන ඒකකය (NOCU), ශ්‍රී ලංකාවේ තිරසාර කාබනික කෘෂිකර්ම පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරීව පහසුකම් සපයන ලදී. මෙම කාලය තුළ, කාබනික කළමනාකරණ සැලසුම් පිළිබඳ අර්ථාන්විත පුහුණුවක් ලබා දෙමින්, ජාතික කාබනික ප්‍රමිතිය ලබා ගැනීම සඳහා ගොවීන්, සැකසුම්කරුවන් සහ යෙදවුම් නිෂ්පාදකයින් 43 දෙනෙකුට සහාය ලබා දෙන ලදී. ඊට අමතරව, ජාත්‍යන්තර කාබනික ප්‍රමිතීන් අනුගමනය කිරීම සඳහා ගොවීන් 500 දෙනෙකු තෝරා ගන්නා ලදී.

දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම සඳහා, මාධ්‍ය හමුවක් මගින් ජාතික කාබනික සහතික කිරීමේ සලකුණ හඳුන්වා දුන් අතර, ප්‍රවෘත්ති පත්‍ර 15 ක සහාය ඇතිව, සහ සහතික කිරීමේ සහතික අටක් නිකුත් කරමින් ජර්මනියේ GIZ සහ ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානය (ITC) හි සහාය ඇතිව ස්වයංක්‍රීය කොටස්කරුවන් ලියාපදිංචි කිරීමේ පද්ධතියක් දියත් කරන ලදී.

කාබනික කෘෂිකර්මාන්තය පිළිබඳ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට තවදුරටත් සහාය වීම සඳහා යුරෝප සහ BMZ විසින් අරමුදල් සපයන ලද සහ GIZ ශ්‍රී ලංකාව විසින් ක්‍රියාත්මක කරන ලද www.nocu.lk නිල වෙබ් අඩවිය දියත් කිරීම මෙම මුලපිරීමට ඇතුළත් විය. ජාතික කාබනික පාලන ඒකකය විසින් රට පුරා කාබනික කොටස්කරුවන් 50 දෙනෙකු ලියාපදිංචි කරන ලද අතර COLEAD බ්‍රසල්ස් සමඟ හවුල්කාරිත්වයෙන් යාවත්කාලීන කරන ලද යුරෝපා කාබනික රෙගුලාසි පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණ කොළඹ, කෑගල්ල සහ මාතර යන නගරවල පවත්වන ලදී. මෙම උත්සාහයන් කාබනික ගොවිතැන් ශිල්පීය ක්‍රම, සහතික කිරීමේ ක්‍රියාවලීන්, ප්‍රමිතීන් සහ වෙළඳපල අවස්ථා පිළිබඳ දැනුම වැඩිදියුණු කළ අතර, ශ්‍රී ලංකාව තුළ විශ්වසනීය හා තිරසාර කාබනික කෘෂිකාර්මික වටිනාකම් දාමයකට දායක විය.

- ඩිජිටල් ප්‍රවර්ධනය - ගෝලීය B2B/B2C ද්වාරයක් ලෙස www.srilankabusiness.com පුළුල් කිරීම.

- ජනාධිපති අපනයන සම්මාන

  2020 සහ 2024 අතර කාලය තුළ, ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට දායක වන කැපී පෙනෙන අපනයනකරුවන් හඳුනා ගැනීමේ ඉහළම ගෞරවය වන කීර්තිමත් ජනාධිපති අපනයන සම්මාන උළෙල අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සාර්ථකව සංවිධානය කරන ලදී. 2021 නොවැම්බර් මාසයේ පැවති 24 වන සම්මාන උළෙල COVID-19 බාධා හේතුවෙන් වසර දෙකක් (2019/20 සහ 2020/21) ඒකාබද්ධ කරමින්, සමාගම් 63 කට සමස්ත සම්මාන 12 ක් සහ ආංශික සම්මාන 46 ක් පිරිනමන ලදී. නිෂ්පාදන සහ වෙළඳපල විවිධාංගීකරණය, අගය එකතු කිරීම, නැගී එන වෙළඳපොළවල් සහ නවෝත්පාදනය ඇතුළු ජාතික ප්‍රතිපත්ති ඉලක්ක සමඟ සමපාත වීම සඳහා නව සම්මාන කාණ්ඩ හඳුන්වා දෙන ලදී.

  2023 නොවැම්බර් මාසයේ පැවති 25 වන සම්මාන උළෙලේදී, 2021/22 සහ 2022/23 සිට අපනයනකරුවන් වාර්ෂිකව සමස්ත සම්මාන 13 ක් සහ ආංශික සම්මාන 51 ක් සහ කුසලතා සම්මාන සමඟ සමරනු ලැබිය. විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයෙකුගේ නායකත්වයෙන් යුත් කීර්තිමත් මණ්ඩලයක් විසින් විනිශ්චය සිදු කරන ලදී.

  රජයේ උපායමාර්ගික අපනයන පුළුල් කිරීමේ මුලපිරීම්වලට සහාය වෙමින් අපනයන විවිධාංගීකරණය, දේශීය වෙළඳ නාමකරණය, තිරසාරභාවය සහ කලාපීය වටිනාකම් දාම සංවර්ධනය සඳහා දායකත්වය මෙම සම්මාන උළෙලේදී අවධාරණය කෙරිණි.

**ආයතනික අභියෝග**

- ආයතනයේ මානව ප්‍රාග්ධනය හිඟ කම නිසා බොහෝ විට පවතින සේවකයෙකුට විශාල කාර්ය භාරයක් කිරීමට සිදුවේ. මෙය එකවර බහු ව්‍යාපෘති කළමනාකරණය කරන විශාල කාර්ය භාරයක් ඇති නිලධාරීන්ට, වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මන්දගාමී වීමට, කාර්යක්ෂමතාව අඩු වීමට සහ අධික ලෙස වෙහෙසට පත්වීමේ අවදානමට හේතු වන අතර එමඟින් අපනයනකරුවන්ට සපයනු ලබන සේවාවන්හි ගුණාත්මකභාවය හා කාර්යක්ෂමතාවයට බලපායි.

- සේවාදායකයින්ට ගුණාත්මක හා කඩිනම් සේවා සැපයීම සම්බන්ධයෙන් අභියෝග. උදා: සේවා පිරිවැය දැරීමට ඇති දුෂ්කරතා, කාලය ගතවීම, යාවත්කාලීන හා නවීන තාක්‍ෂණය / තාක්ෂණික දැනුම නොමැතිකම, සාම්ප්‍රදායික / යල් පැන ගිය නීති සහ රෙගුලාසි හේතුවෙන් වෙනත් ආයතනවල සහාය ලබා ගැනීමට ඇති දුෂ්කරතා, යාවත්කාලීන කාර්මික දත්ත සහ තොරතුරු නොමැතිකම.